# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,237 - 2021 ජූලි මස 16 වැනි සිකුරාදා - 2021.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1524 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1528 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1533 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1534 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1540 |

***සැ. යු.-*** (i) අධිකරණයට අපහාස කිරීමේ පනත් කෙටුම්පත 2021 ජූලි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(ii) මුදල් පනත් කෙටුම්පත 2021 ජූලි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 අගෝස්තු මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජූලි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ වැලි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද වැලි කියුබ් 99ක් **2021.07.26 වැනි දින පෙ. ව. 9.00** ට අරලගංවිල පොලිස් ස්ථාන භූමියේ දී හා වැලි කියුබ් 08ක් දිඹුලාගල ප්‍රාදේශීය සභා භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02.වෙන්දේසියේ මිළ දී ගනු ලබන වැලි සඳහා මුදල් ගෙවීමේදී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් පමණක් ගෙවීම් සිදුකළ යුතු අතර, චෙක්පත් බැංකු අණකර කිසිවක් භාර ගනු නොලැබේ.

03. භාණ්ඩ මිලදී ගැනීමේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා ලද වැලි වෙන්දේසිය පවත්වන දිනයේ දී ප. ව. 5.00 ට පෙර අදාළ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

05. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම්, වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

06. සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් වෙන්දේසිය සඳහා සහභාගි වන ලෙස දන්වා සිටිමි.

හර්ෂණ ධනුෂ්ක රත්නායක,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්.

2021 ජූලි මස 07 වැනි දින,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
පොළොන්නරුව.

| *අනු. අංකය* | *අධිකරණය මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය* | *වැලි කියුබ් ප්‍රමාණය* |
|---|---|---|
| 01. | අරලගංවිල පොලිස් ස්ථාන භූමියේ | 99 |
| 02. | දිඹුලාගල ප්‍රාදේශීය සභා භූමියේ | 08 |

07-408

## මහෙස්ත්‍රාත් අධිකරණය - මඩකලපුව

### ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ නඩු විභාගවල දී රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ **2021.07.31 වැනි දින පෙරවරු 9.00** ට මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමට නියමිතය.

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත්කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහි දී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසි සිදු කරන අවස්ථාවේ දී ම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිඳු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසි සිදු කරන අවස්ථාවේ දී ම ඉදිරිපත් කළයුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිඳු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගි වීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛන සමග පැමිණිය යුතු ය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මඩකලපුව.

2021 ජූලි මස 08 වැනි දින,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මඩකලපුව.

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ විස්තරය

| *අංක* | *නඩු අංකය* | *ලියාපදිංචි අංකය* | *භාණ්ඩ* | *අයිතම ගණන* |
|---|---|---|---|---|
| 1. | B/241/06 | WP-HP 7359 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 2. | 62401/MT/20 | EP BFW-3103 | යතුරු පැදිය | 01 |
| 3. | 62824/MT/20 | EP MG - 9313 | යතුරු පැදිය | 01 |

| අංක | නඩු අංකය | ලියාපදිංචි අංකය | භාණ්ඩ | අයිතම ගණන |
|---|---|---|---|---|
| 4. | 62921/MT/21 | EP BBE - 5930 | යතුරු පැදිය | 01 |
| 5. | 60377/E/20 | | ජංගම දුරකථන | 01 |
| 6. | 62783/PC/21 | | ජංගම දුරකථන | 01 |
| 7. | AR/429/21 | | පාපැදි | 01 |
| 8. | AR/429/21 | | පාපැදි | 01 |
| 9. | AR/429/21 | | පාපැදි | 01 |
| 10. | 63494/S/21 | | පාපැදි | 01 |
| 11. | 63292/S/21 | | සවල් | 01 |
| 12. | 63455/S/21 | | සවල් | 01 |
| 13. | 63399/E/21 | | හිස් බැරල් | 01 |
| 14. | AR/433/21 | | හිස් බැරල් | 04 |
| 15. | AR/434/21 | | හිස් බැරල් | 04 |
| 16. | AR/432/21 | | හිස් බැරල් | 04 |
| 17. | AR/430/21 | | හිස් බැරල් | 02 |
| 18. | AR/428/21 | | හිස් බැරල් | 04 |
| 19. | AR/427/21 | | හිස් බැරල් | 03 |
| 20. | AR/425/21 | | හිස් බැරල් | 02 |
| 21. | AR/426/21 | | හිස් බැරල් | 04 |
| 22. | AR/426/21 | | හිස් බැරල් | 04 |
| 23. | AR/423/21 | | හිස් බැරල් | 02 |
| 24. | AR/422/21 | | හිස් බැරල් | 03 |
| 25. | No Number | | හිස් බැරල් | 02 |
| 26. | | | River Sand | |
| 27. | | | Dirry Soil | |

07-421

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - අක්කරපත්තුව**

අක්කරපත්තුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2021

01. අක්කරපත්තුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාල රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද හා අංක සොයාගත නොහැකි වූ පහත සඳහන් නඩු භාණ්ඩ **2021.07.31 වැනි දින පෙ. ව. 9.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතු ය.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

06. වෙන්දේසිය සඳහා පැමිණෙන්නන් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් වන සියලුම සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කළ යුතු අතර එකී මාර්ගෝපදේශයට අවනතව කටයුතු කල යුතු ය.

දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
අක්කරපත්තුව.

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ | ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | 60341/Misc/21 | වැට කණු | 25 |
| 2 | 60342/Misc/21 | වැට කණු | 30 |
| 3 | 60343/Misc/21 | වැට කණු | 14 |
| 4 | 60345/Misc/21 | වැට කණු | 17 |
| 5 | 60347/Misc/21 | වැට කණු | 14 |
| 6 | 60348/Misc/21 | වැට කණු | 14 |
| 7 | 60906/F/21 | වැට කණු | 50 |
| 8 | 60907/F/21 | වැට කණු | 50 |
| 9 | AR/825/21 | පා පැදිය | 2 |
| 10 | AR/796/21 | පා පැදිය | 1 |
| 11 | AR/816/21 | පා පැදිය | 1 |
| 12 | AR/815/21 | පා පැදිය | 1 |
| 13 | 49582/MT/17 (B/9806/17) | පා පැදිය | 1 |
| 14 | 47338/MT/16 (B/8491/16) | පා පැදිය | 1 |
| 15 | 49547/MT/17 (B/9588/17) | පා පැදිය | 1 |
| 16 | 56276/MT/19 (B/430/19) | පා පැදිය | 1 |
| 17 | 47750/MT/16 (B/9297/16) | පා පැදිය | 1 |
| 18 | 53692/MT/18 (B/374/18) | පා පැදිය | 1 |
| 19 | 45819/MT/16/B/8435/15 | හෙල්මට් | 1 |
| 20 | 43543/PC/15 (B/7880/15) | හෙල්මට් | 1 |
| 21 | 49546/MT/17 (B/8958/17) | හෙල්මට් | 2 |
| 22 | 60581/MISC/21 | සවල් | 1 |
| 23 | 60829/MISC/21 | සවල් | 1 |
| | | උදැල්ල | 1 |
| 24 | 60932/M1SC/21 | යකඩ බාල්දිය | 1 |
| 25 | 60934/MISC/21 | යකඩ බාල්දිය | 1 |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ | ප්‍රමාණය |
|---|---|---|---|
| 26 | B/376/18 | ජංගම දුරකථන | 1 |
| 27 | B/9715/ | ජංගම දුරකථන | 1 |
| 28 | 50762/PC/17 | ජංගම දුරකථන | 2 |
| | | ජල මට්ටම් | 1 |
| | | ලඹ | 1 |
| | | ටේප් පටි පෙට්ටිය | 1 |
| 29 | AR/3695/14 | ස්කෑන් මැෂිම | 1 |
| 30 | 60734/MISC/21 | වැලි | |
| 31 | 60733/MISC/21 | වැලි | |
| 32 | 60738/MISC/21 | වැලි | |
| 33 | 60739/MISC/21 | වැලි | |
| 34 | 60751/MISC/21 | වැලි | |
| 35 | 60829/MISC/21 | වැලි | |
| 36 | 60836/MISC/Zl | වැලි | |
| 37 | 60838/MISC/21 | වැලි | |
| 38 | 60841/MISC/21 | වැලි | |
| 39 | 60837/MISC/21 | වැලි | |
| 40 | 60842/MISC/21 | වැලි | |
| 41 | 60853/MISC/21 | වැලි | |
| 42 | 60871/MISC/21 | වැලි | |
| 43 | 60872/MISC/21 | වැලි | |
| 44 | 60876/MISC/21 | වැලි | |
| 45 | 60902/MISC/21 | වැලි | |
| 46 | 60933/MISC/21 | වැලි | |
| 47 | 60935/MISC/21 | වැලි | |
| 48 | 60941/MISC/21 | වැලි | |
| 49 | 60959/MISC/21 | වැලි | |

07-433

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - අගුණකොළපැලැස්ස**

**මෙම අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කිරීම**

අගුණකොළපැලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදළ රාජසන්තක කරනු ලැබූ මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ **2021.08.20 වැනි දින, පෙ. ව. 10.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් වන භාණ්ඩ පිළිබඳ හිමිකම් දක්වන්නෙකු සිටීනම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කල යුතු ය.

03. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අධීක්ෂණය යටතේ වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගන්නා අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියේ විකිණීමෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දී මුදල් ගෙවිය යුතු අතර, එදිනම ප. ව. 5.00 ට පෙර අදාළ භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. එසේ ම සියලු ගෙවීම් මුදලින් පමණක් සිදු කළ යුතු අතර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගනු ලබන අය තම ජාතික හැඳුනුම්පත හෝ අනන්‍යතාවය තහවුරු කළ හැකි වෙනත් හැඳුනුම්පතක් හෝ ඉදිරිපත් කළ යුතු ය.

එච්. ඩී. දර්ශිමා ප්‍රේමරත්න,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
අඟුණකොළපැලැස්ස.

2021 ජූලි මස 08 වැනි දින,
අඟුණකොළපැලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

මහෙස්ත්‍රාත් අධිකරණය, අඟුණකොළපැලැස්ස

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩය* | *වෙනත් කරුණු* | *නිර්දේශය* |
|---|---|---|---|---|
| 1. | 20771/17 | මෝටර් රථ පරීක්ෂක වාර්තා අනුව ලියාපදිංචි අංක SP LF - 3474 දරන JUEJIN වර්ගයේ ලොරි රථය | | |
| 2. | 13322 | මෝටර් රථ පරීක්ෂක වාර්තා අනුව ලියාපදිංචි අංක රහිත එන්ජින් අංක චැසි අංක රහිත DUTSON වර්ගයේ DOUBLE CAB රථය (කැබලි ලෙස) | | |
| 3. | 13340 | මෝටර් රථ පරීක්ෂක වාර්තා අනුව ලියාපදිංචි අංක රහිත චැසි අංක GN 121 - 9620 දරන එන්ජින් අංක රහිත SENFIN - GN 121 දරන ට්‍රැක්ටර් රථය (කැබලි ලෙස) | | |
| 4. | 1366/20 | මෝටර් රථ පරීක්ෂක වාර්තා අනුව ලියාපදිංචි අංක රහිත එන්ජින් අංකය හා චැසි අංක රහිත SIFANGE වර්ගයේ ට්‍රැක්ටරය හා ට්‍රේලරය (කැබලි ලෙස) | | |

07-465

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - අනුරාධපුර

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2022 වර්ෂය

2022 වර්ෂයට පහත දැක්වෙන තැබෑරුමේ පැසුනු රා විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර පහත සඳහන් කොන්දේසිවලට යටත් ව භාරගනු ලැබේ :-

(i) 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි,

(ii) සියලු සුරාබදු නීතිය යටතේ දැනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි.

02. මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද සෑම ටෙන්ඩර් පතක් ම රු. 2,000 ක මුදලක් ගෙවා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් සමග ඉදිරිපත් කළ යුතු ය.

03. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය සමග ඔවුන්ට අයත් නිශ්චල දේපළවල වටිනාකම් සහතිකයක් ප්‍රාදේශීය මහලේකම් තැනගෙන් ලබාගෙන ඇමිණිය යුතු ය. එය තැබෑරුමට ඉල්ලුම් කරන ටෙන්ඩර් මුදලේ වටිනාකමෙන් සියයට පහළොවකට (15%) නොඅඩු සහතිකයක් විය යුතු ය. මෙම ඡේදයේ සඳහන්වන සහතිකයට අදාළ නිශ්චල දේපළ මෙකී රේන්ද කාලය තුළ දී විකිණීමට හෝ පැවරීමට තහනම් වන්නේ ය. මෙය කඩ කරන අයගේ ගිවිසුම අවලංගු වූවා සේ සැලකේ.

04. සෑම ටෙන්ඩර් පතක් ම සීල් තබන ලද කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ ''2022 වර්ෂය සඳහා අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කර **2021 අගෝස්තු මස 02 වැනි දින පෙරවරු 10.30** ට පෙර අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතු ය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන්නේ නම් ඒවා ලියාපදිංචි තැපෑලෙන් ඉහත සඳහන් පරිදි එවිය යුතු ය. 2021.08.02 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩරය විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් අදාළ දින නියමිත වේලාවට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පතු මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල මුදලින් ගෙවිය යුතු ය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් තැන්පත් කිරීම පැහැර හැරියහොත් හෝ ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වූ බව ප්‍රකාශ කරනවාත් හැර එය පැහැර හරින්නාගේ නම සියලු සුරාබදු බලපත්‍රවලට අදාළ පැහැර හරින්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු සියලුම ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

07. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලු ම ටෙන්ඩර්පත්‍ර කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ :-

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රදේශය හා කොටස* | *තැබෑරුම විවෘත කරන වේලාව* |
|---|---|---|---|
| 01 | අනුරාධපුර | අනුරාධපුර නගරයේ නගර සීමාව තුළ | පෙ. ව. 10.00 සිට ප. ව. 2.00 දක්වා<br>ප. ව. 5.00 සිට ප. ව. 9.00 දක්වා |

09. තනි බලයලත් පුද්ගලයා විසින් එහි අට (08) වැනි ඡේදයේ සඳහන් ප්‍රාදේශීය ලේකම් විසින් වෙන් කර දී ඇති ප්‍රාදේශීය පෙදෙසේ ගොඩනැගිල්ලක් සකස් කළ යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් යෝජිත ස්ථානයක් සපයාගත යුතු ය. ප්‍රාදේශීය ලේකම්ගේ

අනුමැතිය ලබාගෙන මිස තැබෑරුම වෙනත් ස්ථානයක විවෘත නොකළ යුතු අතර, එසේ කිරීමට ගතයුතු අනුමැතිය බලය ලැබීමේ අනුමැතිය ආරම්භ වීමට දින 14 කට පෙර ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත යුතු ය.

10. රා තැබෑරුම පවත්වාගෙන යන ගොඩනැගිල්ල කිසියම් රජයේ ආයතනයකට, සංස්ථාවකට හෝ පළාත් පාලන ආයතනයකට අයත් වන විට රේන්දයට අදාළ සම්පූර්ණ කාලයට එම ගොඩනැගිල්ල වෙනුවෙන් අදාළ ආයතනයට බද්ද ගෙවා ඒ බැව් ගිවිසුමේ අත්සන් කිරීමට පෙර සනාථ කළ යුතු ය.

11. මේ සම්බන්ධයෙන් විස්තර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත යුතු ය.

12. *වැදගත්* .- 2021.08.02 වැනි දින රා රේන්ද විකිණීමට නොහැකි වුවහොත් 2021.09.02 වැනි දින පෙරවරු 10.30 ට නැවත විකුණනු ලැබේ.

ඊ. එම්. ආර්. පී. බී. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
නැගෙනහිර නුවරගම් පළාත,
අනුරාධපුර.

2021 ජූලි මස 01 වැනි දින.

07-362

---

**කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2022 වර්ෂය සඳහා රා තැබෑරුම් විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව, 2022 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් **2021.08.10 වැනි දින පෙ. ව. 10.30** දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතු ය.

*(ආ)* ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර නිල කුවිතාන්සියක් සහ,

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳ යථොක්ථ රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතු ය ඃ

*(a)* ටෙන්ඩර්පත්‍ර මුලුමනින් ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

*(b)* සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතු ය.

*(c)* සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

*(d)* සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝර්මය සමග තම ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා නිල කුවිතාන්සියක් වත්කම් පිළිබඳ සහතිකයත් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''නියමිත තැබෑරුම් අංකය සහ නම'' සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත්වීමට පෙර ''ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාරගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම, එදින ප. ව. 2.00 ට පෙර, ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. එම මුදල මා නමින් පුණ්ඩළුඔය මහජන බැංකුවේ වර්ෂයක ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

08. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

10. යම් රා තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් **2021.09.10** වැනි දින පෙ. ව. **10.30** ට මෙම ස්ථානයේ දී ම විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකි ය.

ඕ. එස්. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්.
කොත්මලේ.

2021 ජූලි මස 01 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීම අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| *රා තැබෑරුම් :* | | | |
| අංක 1 - කඩදොරපිටිය | කඩදොරපිටිය ග්‍රාමය තුළ | 2021.08.10 පෙ. ව. 10.30 | 5,000 |
| අංක 2 - ඕතලාව | තෝරාගනු ලබන ස්ථානයකට කොත්මලේ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු ය | 2021.08.10 පෙ. ව. 10.30 | 5,000 |
| අංක 3- කටුකිතුල | කටුකිතුල ග්‍රාමය තුළ | 2021.08.10 පෙ. ව. 10.30 | 5,000 |

07-424/1

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ 2021/2022 වර්ෂයේ රා, තැබෑරුම් රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂයේ හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්වාගෙන යනු ලබන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2021/2022 වර්ෂය තුළ රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වන මවිසින් **2021.08.17 වැනි දින පෙරවරු 10.30** වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයකින් සකස් විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් කර ඇති අන්දමට ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය ;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය ;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපාහැරීමක් මත ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය ;

(iv) අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබාගන්නා ලද -

*(අ)* ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ කුවිතාන්සිය ; සහ
*(ආ)* වත්කම් සහතිකයක්,

සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබන ලද ලියුම් කවරයෙහි වම් ඉහළ කෙළවරේ "තැබෑරුමේ නම සහ අංකය" සඳහන් කර මහනුවර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු යි. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම්තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් රේන්දයක් වෙනුවෙන් භාර ගැනීම අවසන් කරන වේලාව උපලේඛනයෙහි සඳහන් කර ඇත. එම වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය අතුරින් වරප්‍රසාද මිල දී ගත් තැනැත්තායි ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු එම තැනැත්තා විසින් එම දින පස්වරු 2.30 ට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලබන මුදලක් ඇප වශයෙන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් **"ගෙවීම සඳහා"** යැයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් **"ආරක්ෂිත චෙක්පත "** නමැති ස්වරූපයකින් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට මත්පැන් තැබෑරුම් කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය.

06. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි ය.

07. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවළුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙන ම පැහැදිලිව දැක්විය යුතු ය.

08. රා තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රයක් ලත් ස්ථානවල හෝ විකිණීම සඳහා තොග (පීප්ප) රා නිකුත් නොකරනු ලබන බව සැලකිය යුතු ය.

09. මහනුවර ඇසළ පෙරහැර සමයේ දී හා වෙනත් හේතුන් මත මෙහි උපලේඛනයේ සඳහන් අංක 01 දරන රා තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තැබීමේ කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2021.09.17 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි හෝ වෙනත් වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය.

2021 ජූලි මස 12 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

**2021/2022 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව**

| *අනුක්‍රමික අංක/ කොට්ඨාසය/ තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය/ තැබෑරුම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම් විවෘත කරන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| 1. අංක : 1 වටපුළුව | මහනුවර කොට්ඨාසයේ අංක 20 මහයියාව සහ අංක 7 මාපනාවතුර ඡන්ද කොට්ඨාසය | කටුගස්තොට පාරේ, එම පාර සහ ත්‍රිකුණාමල වීදිය මංසන්දියෙහි, කටුගස්තොට පාර සහ වට්ටාරන්තැන්න මංසන්ධිය අතර පාර මහනුවර නාගරිකයේ අංක 20 මහයියාව සහ අංක 7 මාපනාවතුර ඡන්ද කොට්ඨාසය තුළ පිහිටි ප්‍රදේශය | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා සහ ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2021.08.17 දින පෙ. ව. 10.30 |

*රා තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල - 2021/2022 :*

| |
|---|
| අංක 1 වටපුළුව - රා තැබෑරුම් රේන්දය රුපියල් 5,000. |

07-562/1

# රජයේ නොවන දැන්වීම්

## දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

සමාගම් නාමය : නිව් ලැන්ඩ් ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම්
සමාගම් අංකය : PV 103566
ලිපිනය : 432, දියකලමුල්ල, කුලියාපිටිය.

සමාගම් ලේකම්.

07-365

---

## දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

සමාගම් නාමය : ඒ. ඒ. එස්. ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම්
සමාගම් අංකය : PV 68864
ලිපිනය : දියකලමුල්ල, කුලියාපිටිය.

සමාගම් ලේකම්.

07-366

---

## දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ (9) 1 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : බ්‍රවුන් ග්‍රෝ ට්‍රේඩිං (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පීවී 130728
ලියාපදිංචි කාර්යාලය : නො. 521/A, රාජපක්ෂ එස්ටේට්, තබ්බෝව, නාත්තන්ඩිය
ලියාපදිංචි දිනය : 2018.03.15

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් (පීවීටී) එල්ටීඩී.

07-381

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ මුරුතලාව, සූරියගොඩ අංක 339 දරන ස්ථානයේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ නිශ්ශංක රත්නායක (ජා. හැ. අංක 491322950 V) වන මම මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එන්. කිනිගම මහත්මිය විසින් සහතික කළ අංක 2367 සහ 2016 ජූලි 08 දින දරන විශේෂ ඇටෝර්නි බලකරය මගින් මුරුතලාව, ඉලුක්තැන්න චන්ද්‍රසිරි වෙළඳ සැල ''ලක්මාල්'' අංක 1/288 දරන ස්ථානයේ පදිංචි රාජකරුණා වාසල මුදියන්සේලාගේ එරංග ලක්මාල් රාජකරුණා (ජා. හැ. අංක 832794023 V) මාගේ ඇටෝර්නි බලකාරයා ලෙස පත්කර ඇති අතර එකී පත්කිරීම මෙයින් ප්‍රතිඥ කර අවලංගු කරන ලද බව මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

07-422

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

අංක 731, කහකොරටුව, වැලිව, මොරවක ලිපිනයැති ජා. හැ. අංක 663554050 V හිමි ජාසිං ලියනගේ බන්ධුල වන මවිසින් පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ලක්නා ඩබ්. රුහුණු ආරච්චි මහත්මියගේ අංක 100 සහ 2015.12.23 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් කොළවෙනිගම, පල්ලෙගම දකුණ, අලුත් වත්තගොඩ අංක 147/ඒ හි පදිංචි ජා. හැ. අංක 762083795 V හිමි ලන්දගෙයි දෙන් ඉන්දික රොහාන් මහතාට ලබාදුන් විශේෂ ඇටෝර්නි බලය වර්ෂ 2021.06.23 දිනයෙන් පසු අහෝසි වන බව සියල්ලෝ ම දැනගනිත්වා.

ජාසිං ලියනගේ බන්ධුල.

07-490

---

## ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීම

කොළඹ 05, අලුත් මාවත පාර, ෆලෝරිඩා රෙසිඩන්සීස්, අංක 655 1/3 යන ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 472441582 V දරන සතාසිවම් රාජසිංහම් සහ බත්තරමුල්ල, ධම්මෝදය මාවත, මිහිඳුපුර, අංක 1127/12 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 500773766 V හිමි සතාසිවම් අමරසිංහම් යන අප දෙදෙනා වර්ෂ දෙදහස් දහ නවයක් වූ (2019) අගෝස්තු මස පළමුවන (01) දින ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ ලිඛිත බලධාරිකම් සහ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 283 කාණ්ඩයේ 10 පත් ඉරුවෙහි 13163 දින පොත් අංකය යටතේ ලියාපදිංචි කරන ලද සාමාන්‍ය ඇටෝර්නි බලපත්‍රය මගින් මන්නාරම, නානත්තාන්, මොඩ්ඩක්කාඩායි යන ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 600813331V දරන පාලනිසාමි පරරාසසින්හම් යන අය වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙම දැන්වීමේ දින සිට බලපැවැත්වෙන පරිදි මින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලංකාවාසී සියලු දෙනා හට මින් දැනුම් දෙමු.

සතාසිවම් රාජසිංහම්,
සතාසිවම් අමරසිංහම්.

07-511

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

පන්නිපිටිය, දෙපානම, දේවාල පාර, අංක 08 ලිපිනයේ පදිංචි ජා. හැ. අංක 780170719 V හිමි ලියන මුදියන්සෙලාගේ ලක්මාල් ෂමෙන්ද සරත්චන්ද්‍ර වන මා විසින් ඉහත ලිපිනයේ ම පදිංචි ජා. හැ. අංක 472561197 V හිමි ලියන මුදියන්සෙලාගේ සුනිල් සරත්චන්ද්‍ර වෙත පවරා දී ඇති වර්ෂ 2005ක් වූ ජුනි මස 01 වැනි දිනැති, ප්‍රසිද්ධ නොතාරිස් කාන්ති එස්. රණසිංහ විසින් සහතික කළ අංක 830 දරන ඇටෝර්නි බලපත්‍රය මින් අවලංගු, ශුන්‍ය හා බලරහිත වන බවත් මින් ඉදිරියට එකී ඇටෝර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගණුදෙනුවකට මා වග නොකියන බව ද මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා සියලු මහජනතාව වෙත දන්වමි.

ලියන මුදියන්සෙලාගේ ලක්මාල් ෂමෙන්ද සරත්චන්ද්‍ර.

07-512

---

# රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

### 2022 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ විදේශ මත්පැන් රේන්දය විකිණීම

2022 ජනවාරි මස 01 වැනි දින සිට 2022 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා විදේශ මත්පැන් සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකට අදාළ එවකට බලපවත්වන කොන්දේසි මාලාවට යටත්ව පහත උපලේඛනයේ සඳහන් විදේශ මත්පැන් තැබෑරුම පවත්වාගෙන යාම සඳහා සුදුසු ගැණුම්කරුවකු තෝරාගැනීම පිණිස ටෙන්ඩර් භාර ගැනීම හොරණ ප්‍රාදේශීය ලේකම් වන මා විසින් **2021.08.09 වැනි දින පෙ. ව. 10.30** දක්වා සිදු කරනු ලැබේ.

**1. අංක 01 හොරණ විදේශීය මත්පැන් තැබෑරුම -**

02. *(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල වෙනුවෙන් රු. 3,000 ක් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමඟ සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත් නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍ර මගින් දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ය.

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩර් පත්‍රයට අමුණා තැබිය යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර්පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. සඳහන් කරන මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවීම කළ යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරමවල නියමිත පරිදි සාක්ෂිකරුවන්ගේ අත්සන යොදා ඔවුන්ගේ ලිපිනයන් ද සඳහන් කර තිබිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කර තිබිය යුතු ය.

*(ඇ)* මෙම නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කළ යුතු අතර, නියෝජිතයකු විසින් හෝ ලාංකික නොවූ හෝ 1982.08.20 වැනි දින අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද විදේශීය මත්පැන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු අයගෙන් ටෙන්ඩර්පත්‍ර භාර ගනු නොලැබේ.

04. විධිමත්ව සකස් කරන ලද ටෙන්ඩර් පත්‍ර කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවරේ '' අංක 01 හොරණ විදේශීය මත්පැන් තැබෑරුම් ටෙන්ඩරය 2022'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. එසේ සකස් කළ ටෙන්ඩර් පත්‍ර සහිත කවර,

*(අ)* හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, හෝ

*(ආ)* ලියාපදිංචි තැපෑලෙන් එවන්නේ නම් **2021.08.09 වැනි දින** පෙ. ව. **10.30** වේලාවට පෙර කාර්යාලයට ලැබෙන සේ "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හොරණ" යන ලිපිනයට එවිය යුතු ය. ඉහත සඳහන් වේලාවෙන් පසුව තැපෑලේ දී ප්‍රමාද වී කාර්යාලයට ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩරය විකුණන දින නියමිත වේලාවට සියලුම ටෙන්ඩර්කරුවන් හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතු ය. මෙහි 3 වැනි ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසිය යටතේ නුසුදුස්සෙකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් ඊට අවශ්‍ය ලියකියවිලි ද රැගෙන ආ යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බැව් දැන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා හොරණ ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතු ය.

06. 2022 වර්ෂයට දැනට තැබෑරුම පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. අලුත් ස්ථානයක තැබෑරුම විවෘත කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් හොරණ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

07. වැඩි විස්තර හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් දැනගත හැකි ය.

මෙම දැන්වීම අනුව 2021.08.09 වැනි දින දී මෙම රේන්දය විකිණීමට නොහැකි වුවහොත් පමණක් 2021.09.09 වැනි දින පෙ. ව. 10.30 දක්වා විකිණීම පිණිස ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන බව ද එසේම නැවත විකිණීම ද **2021.09.09 වැනි දින පෙ.ව. 10.30ට** සිදු කරන බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඩී. එස්. සජීවනා,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

2021 ජූලි මස 02 වැනි දින,
හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***හොරණ අංක 01 දරන විදේශ මත්පැන් රේන්දය විකිණීම -2022***

| *අනු. අංකය* | *කොට්ඨාසයේ නම* | *පළාත් පාලන බල ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කර තබන වේලාවන්* | *තැබෑරුම් රේන්දය විකිණීමට ටෙන්ඩරය භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *2020.08.13 දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීමේ දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|
| 01. | හොරණ | හොරණ නගර සභා සීමාව | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2021.08.09 දින පෙ. ව. 10.30 | 3,000 | 2021.09.09 දින පෙ. ව. 10.30 ට |

07-347

---

**කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2022 වර්ෂය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව, 2022 වර්ෂය තුළ දී පහත දැක්වෙන උපලේඛනයේ දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුලුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් **2021.08.10** වැනි දින **පෙ. ව. 10.30** දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් විය යුතු ය.

*(ආ)* ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර නිල කුවිතාන්සියක් ; සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳ යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැළකිලිමත් විය යුතු ය :

*(a)* ටෙන්ඩර්පත්‍ර මුලුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

*(b)* සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතු ය.

(c) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(d) සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝරමය සමග තමන්ගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකය සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර ''ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ''යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම, එදින ප. ව. 2.00 ට පෙර, ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. එම මුදල මා නමින් පුණ්ඩළුඔය මහජන බැංකුවේ වාර්ෂික ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක් පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

08. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

10. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් **2021.09.10 වැනි දින පෙ. ව. 10.30** ට මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකි ය.

ඕ. එස්. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ.

2021 ජූලි මස 01 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීම අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| විදේශ මත්පැන් තැබෑරුම : අංක 2 - පුණ්ඩළුඔය | පුණ්ඩළුඔය නගරය පහළ කඩ වීදිය | 2021.08.10 පෙ. ව. 10.30 | 5,000.00 |

07-424/2

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය

### විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2021/2022 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1983 වර්ෂයේ හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගුව පවත්වාගෙන යන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2021/2022 වර්ෂය තුළ විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා මහනුවර, කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වන ම විසින් **2021.08.17 වැනි දින පෙරවරු 10.30** වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයකින් සකස් විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් කර ඇති අන්දමට ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත්කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථොක්ත විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය.
(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය.
(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් මත ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.
(iv) අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ලද,

*(අ)* ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ කුවිතාන්සිය ; සහ
*(ආ)* වත්කම් සහතිකයක්,

සමග ලියුම් කවරයක බහා, මුද්‍රා තබන ලියුම් කවරයෙහි වම් ඉහළ කෙළවරේ "තැබෑරුමේ නම සහ අංකය" සඳහන් කර මහනුවර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම මහනුවර ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් රේන්දයක් වෙනුවෙන් භාරගැනීම අවසන් කරන වේලාව උපලේඛනයෙහි සඳහන් කර ඇත. එම වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය අතුරින් වරප්‍රසාද මිල දී ගත් තැනැත්තායි ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු එම තැනැත්තා විසින් එම දින පස්වරු 2.30 ට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය. මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් "ගෙවීම සඳහා" යැයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂිත චෙක්පත්" නමැති ස්වරූපයකින් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට මත්පැන් තැබෑරුම් කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය.

06. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකිය.

07. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙන ම පැහැදිළිව දැක්විය යුතු ය.

08. විදේශ මත්පැන් තැබෑරුම් හෝ වෙනත් බලපත්‍රයක් ලත් ස්ථානවල හෝ විකිණීම සඳහා තොග විදේශ මත්පැන් නිකුත් නොකරනු ලබන බව සැලකිය යුතු ය.

09. මහනුවර ඇසළ පෙරහැර සමයේ දී හා වෙනත් හේතු මත මෙහි උපලේඛනයේ සඳහන් අංක 01 දරන විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තැබීමේ කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකිවූ විදේශ මත්පැන් තැබෑරුම්, නැවත විකිණීම 2021.09.17 වැනි දින පෙ.ව. 10.30ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසන් තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි හෝ වෙනත් වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර, කඩවත් සතර සහ ගඟවට කෝරළය.

2021 ජූලි මස දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***2021/2022 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව***

| *අනුක්‍රමික අංක කොට්ඨාසය/ තැබෑරුම් පිහිටුවිය යුතු කොට්ඨාසය/ තැබෑරුම* | *කොට්ඨාසය* | *තැබෑරුම් පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම් විවෘත කරන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| 1. අංක : කොළඹ වීදිය | මහනුවර නාගරිකයේ අංක 17 යටිනුවර සහ අංක 18 කොටුගොඩැල්ල වීදිය | මහනුවර නාගරිකයේ අංක 17 යටිනුවර සහ අංක 18 කොටුගොඩැල්ල ඡන්ද කොට්ඨාසය තුළ කොළඹ වීදිය සහ කාසල්හිල් වීදිය මංසන්ධියෙන් කොළඹ වීදිය වඩුගොඩපිටිය පාරේ මංසන්ධියටත් අතර කොළඹ වීදිය දෙපාර්ශවයේ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2021.08.17 පෙ.ව. 10.30 |

*විදේශ මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල* - 2021/2022

| |
|---|
| 1. අංක 1 කොළඹ වීදිය විදේශ මත්පැන් තැබෑරුම් රේන්දය - රුපියල් 5,000. |

07-562/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ වර්ෂ **2021 ක් වූ අගෝස්තු මස 09 වැනි දින ප. ව. 2.30ට** දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. බස්නාහිර පළාතේ, (මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, දාසිය පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කෝවින්න අංක 151 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, කෝවින්න ගම පිහිටි ''තේක්කවතු කැබැල්ල'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් මැන සාදන ලද වර්ෂ 2015.12.04 වන දිනැති අංක 6961 දරන පිඹුරේ කැබලි අංක 5 (ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. සෙනෙවිරත්න විසින් මැන සාදන ලද වර්ෂ 2008.03.10 වැනි දිනැති අංක 37 දරන තැගි ඔප්පුවේ සඳහන් වන ''තේක්කවතු කැබැල්ල''නමැති ඉඩමේ නැවත මැනුමක් හා අනුබෙදීමක් වේ.)

(විශාලත්වය අ. 0, රූ. 01, පර්. 30)

2. බස්නාහිර පළාතේ, (මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, දාසිය පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කෝවින්න අංක 151 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, කෝවින්න ගම පිහිටි ''තේක්කවතු කැබැල්ල'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් මැන සාදන ලද වර්ෂ 2015.12.04 වැනි දිනැති අංක 6961 දරන පිඹුරේ කැබලි අංක 2 (ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. සෙනෙවිරත්න විසින් මැන සාදන ලද වර්ෂ 2008.03.10 වැනි දිනැති අංක 37 දරන තැගි ඔප්පුවේ සඳහන් වන ''තේක්කවතු කැබැල්ල'' නමැති ඉඩමේ නැවත මැනුමක් හා අනුබෙදීමක් වේ.)

විශාලත්වය : අක්. 0, රූ. 01, පර්. 35.80)

ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. ඒ. දයානන්ද විසින් සහතික කරන ලද වර්ෂ 2016.08.12 වැනි දිනැති අංක 298 සහ 300 උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදුකිරීම එයාර්පෝට් සිටි හබ් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ''බන්ධනදායී/උකස්කරු'' ලෙස ද සහ උපුල් චමින්ද පෙරේරා කුමාරසිංහ (බන්ධනදායී සමාගමෙහි අධ්‍යක්ෂක) යන අය ''උකස්කරු'' ලෙස ද පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2018.06.01 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රය* ද, වර්ෂ 2018.05.18 දිවයින, දි අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත් පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කොළඹ සිට මීගමුව මාර්ගයේ කි. මී. 24ක් කටුනායක දක්වා ගොස් දකුණට ඇති කටුනායක මිනුවන්ගොඩ පාරට හැරී, කි. මී. 5ක් පමණ යන විට දකුණට ඇති ගංගාරාම පාරේ නැවත මීටර් 500ක් ගිය විට සිටිහබ් හෝටලයට යාමට ඇති මාර්ගයට පෙර ඇති මාර්ගයෙන් දකුණට හැරී මීටර් 200 ක් යන විට එම මාර්ගය අවසානයේ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 500 ද,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු - නීති පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක 011 - 4667227/011-4667220.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, මාවිල්මඩ,
මහනුවර.
දුරකථන අංක : 071 8446374, 077 7761706
ෆැක්ස් : 081 12210595

07-257

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, (කොළඹ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා බලසීමාව ඇතුළත, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි වසමේ, බම්බලපිටිය අංක 38 කොට්ඨාසයේ බම්බලපිටියෙහි, කොල්ලුපිටිය දුම්රිය මාර්ග වෙන් කිරීම දිගේ පැල්මයිරා ඇවනිවු වලට ඔබ්බෙන් කොල්ලුපිටියේ පිහිටා ඇති වර්තමානයේ වරිපනම් අංක 24 (කොටස) පැල්මයිරා ඇවනිවු යන පස, ගොඩනැගිලි, ගහකොළ වගාවන් සහ ඒ මත පිහිටි අනෙකුත් සියල්ල ද සමග වන බලයලත් මිනින්දෝරු කේ. කනගසිංගම් විසින් සම්පාදිත වර්ෂ 2008.05.28 වැනි දිනැති අංක 577 පිඹුරෙහි නිරූපිත ලොට් 1 (බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් සම්පාදිත වර්ෂ 2005.11.16 වැනි දිනැති අංක 511/2005 දරන මිනුම් පිඹුරෙහි නිරූපිත ලොට් 1 හි නැවත මැනුමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල වේ.

(විශාලත්වය අ. 0, රූ. 0, පර්. 6.01)
**වර්ෂ 2021ක් වූ අගෝස්තු මස 09 වැනි දින පෙ. ව. 10.00 ට**

*දේපළට පිවිසෙන මාර්ගය.* - කොල්ලුපිටිය හන්දියේ සිට බම්බලපිටිය දෙසට මරයින් ඩ්‍රයිව් (Marine Drive) දිගේ කි. මී. 1.8ක් පමණ ගමන් කළ විට වම් පසට වන්නට විෂයගත දේපළ පිහිටා ඇත.

ජෙන්ටීල් ටුවරිස්ට් ලොජින් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් ද ජෙන්ටීල් ටුවරිස්ට් ලොජින් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂක වන රාජපක්ෂ අප්පුහාමිලාගේ දොන් සුරේන්ද්‍ර වසන්ත පෙරේරා උකස්කරු වශයෙන් ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. මධුමාලි විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.10.21 දිනැති අංක 220 දරන උකස් බැදුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2017.12.30 වැනි දින තිනක්කුරල්, දි අයිලන්ඩ් දිවයින පුවත්පත් සහ වර්ෂ 2018.01.12 වැනි දින ගැසට් පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලේ 10%ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු කළමණාකරු - ණය අයකර ගැනීම් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක 011 - 4667230.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, මාවිල්මඩ,
මහනුවර.
දුරකථන අංක : 081 - 2210595, 071 4755974, 071- 4962449

07-258

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - හොරණ ශාඛාව**

1990 අංක 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ වෙන්දේසියේ විකුණුම් දැන්වීම

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වාසියට ශාන්ත හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද ස්ථාවර ණය ආපසු ගෙවීමට සුරක්ෂිතයක් වශයෙන්, හොරණ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එෆ්. කේ. එන්. කන්නන්ගර විසින් හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. හි වාසියට ලියා සහතික කරන ලද අංක 5620 හා 2016.01.21 වැනි දින දරන බැඳුම්කරය මගින් ශාන්ත හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස සහ උඩගම ලියනගේ උපුල් ශාන්ත, ඉහත කී ශාන්ත හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි නියම හිමිකරු මෙන්ම, එය පාලනය කරන පුද්ගලයා වන අතර, තවද ශාන්ත හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ඉහත කී උඩගම

ලියනගේ උපුල් ශාන්ත එකී සමාගමේ පාලනය සහ කළමණාකාරිත්වය දරන අතර ඒ අනුව හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. විසින් ශාන්ත හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද මූල්‍ය පහසුකමේ සත්‍ය ප්‍රතිලාභියා උඩගම ලියනගේ උපුල් ශාන්ත වේ. ශාන්ත හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ උඩගම ලියනගේ උපුල් ශාන්ත විසින් පැහැර හැර ඇති බැවින් සහ බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් දේපළ,

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් **2021 අගෝස්තු 06 වැනි දින පෙ. ව. 11.30 ට** දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(මෙම වෙන්දේසිය Covid 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගඟබඩ පත්තුවේ පස්දුන් කෝරළේ ගඟබඩ පත්තුවේ බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත 821 ඩී - එගල්ඔය ග්‍රාම නිලධාරි වසම තුළ බුලත්සිංහල ගමේ පිහිටි ''කනනේගොඩැල්ල'' නමැති ඉඩම බලයලත් මිනින්දෝරු සේනක විතාරගේ විසින් සාදන ලද අංක 5840 හා 2014.06.27 වැනි දින දරන පිඹුරේ ලොට් ''ඒ'' දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හතක් වූ (අ. 0, රූ. 0, පර්. 4.7) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුලුව සියලු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2019.11.22 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද 2019.11.25 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - හොරණ නගරයේ සිට බැල්ලපිටිය හන්දිය දක්වා අගුරුවාතොට මාර්ගයේ කි. මී. 03ක දුරක් පැමිණ (කි. මී. 3 කණුව දක්වා) කලවැල්ල මාර්ගය දෙසට වමට හැරී එගල්ඔය හන්දිය දක්වා කි. මී. 15ක පමණ ප්‍රමාණයක් ඉදිරියට යන්න. වටිනාකම දක්වා ඇති දේපළ මෙම මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-*

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු ය. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10, ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක 011 - 2661866, 011 - 2661828.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30)ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාමවිනිසුරු (මුළු දිවයිනටම)

නො. 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක : 011 - 2053286/072 3207533
076 - 9217329/072 0881044.

07-281

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කුරුඳුවත්ත ශාඛාව**

1990 අංක 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. විසින් පෝද්දිවල හේවගේ රුවන් සාගර චතුරංග සහ හෙට්ටිආරච්චිගේ සචී දෟපදි රොද්‍රිගු වෙත ප්‍රදනය කරන ලද නිවාස ණය පහසුකම ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැංකුව විසින් පී. එල්. සී. හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 11672 හා 2018.03.22 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ණයකරුවන් වශයෙන් පෝද්දිවල හේවගේ රුවන් සාගර චතුරංග සහ හෙට්ටිආරච්චිගේ සචී දෟපදි රොද්‍රිගු විසින් පැහැර ඇර ඇති බැවින් සහ බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය

මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් දේපළ.

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් **2021 අගෝස්තු මස 09 වැනි දින පෙ. ව. 11.30** ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ. ගම්පහ දිස්ත්‍රික්කයේ, දූනගහ පත්තුවේ අලුත්කුරු කෝරළේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ මදිහියාම අංක 92 සී දරන ග්‍රාම නිලධාරී වසම තුළ කිඹුලාපිටිය ගමේ පිහිටි දමින්ගහවත්ත පාර, වරිපනම් අංක 35/4 දරන දමින්නගහ වත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද අංක 4493 හා 2014 දෙසැම්බර් මස 10 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 10 (බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද අංක 4461 හා 2014 නොවැම්බර් 07 වැනි දින දරන පිඹුරේ ලොට් අංක ඒ වශයෙන් ලකුණු කරන ලද ඉඩමේ අනු බෙදීමකි) දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම නමයයි බිංදුවක් වූ (අ. 0, රූ. 0, පර්. 10.90) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළුව අංක 4493 දරන පිඹුරේ ලොට් 13 සහ එකී අංක 4050 දරන පිඹුරේ ලොට් 2 (අඩි 20ක් පළල) සහ ලොට් 3 (අඩි 20ක් පළල) යන මාර්ග සඳහා වෙන්කිරීම් මතින් සහ ඒ ඔස්සේ වන මාර්ග අයිතීන් ද සමග වේ. (මෙම වෙන්දේසිය Covid 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*වැඩි විස්තර සඳහා* .- 2020.12.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද 2021.01.25 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්පත් වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කොළඹ සිට මීගමුව මාර්ගය ඔස්සේ 18 වන සැතපුම් කණුව හන්දිය හමුවන තෙක් ගමන්කර (කටුනායක - ගුවන් තොටුපළ මාර්ගය මංසන්ධිය කි. මී. 28.80) ඉන්පසුව වම්පසින් ඇති කිඹුලාපිටිය මාර්ගයට හැරී කි. මී. 1.10 පමණ දුරක් ඉදිරියට ගොස් (දමින්නගහ වත්ත හන්දිය) ඉන්පසුව ඔබගේ දකුණු අත පැත්තේ ඇති දමින්නගහ වත්ත පාරට හැරී මීටර් 600ක් පමණ ඉදිරියට ගොස් ''මෙට්‍රෝ ලෑන්ඩ්ස්'' යනුවෙන් හඳුන්වනු ලබන විශාල දේපළ වෙන්දේසි ඉඩමක් වෙත ගමන් කරනු ලබන ඔබගේ වම් අත පැත්තේ ඇති අඩි 20 පළල පාරට හැරීමෙන් පසුව මෙම අඩි 20 පළල පාරට මුහුණ ලා ඔබගේ වම් අත පැත්තේ ඇති කැබලි අංක 02 දරන ඉඩම් කොටස මෙම අදාළ වෙන්දේසි ඉඩම් කොටස වේ.

*ගෙවීමේ ක්‍රමය.-*

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% දේශීය විකුණුම් බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකයට අදාළ මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු ය. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10, ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක 011 - 2661866, 011 - 2661828.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30)ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාමවිනිසුරු (මුළු දිවයිනටම).

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක : 011 - 2053286/072 3207533
076 - 9217329.

07-282

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

කොළඹ 01, ජනාධිපති මාවතේ, අංක 69 හි සෙලින්කෝ හවුස් නැගෙනහිර කොටසෙහි 10 වන මහලෙහි, එන්ට්‍රස්ට් සිකියුරිටීස් පී. එල්. සී හි ණය වගකීම් වෙනුවෙන් කොළඹ 03, අබ්දුල් ගෆූර් මාවතේ වරිපනම් අංක 06 හි පිහිටි උකස් කරන ලද දේපළ.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019

නොවැම්බර් මස 08 දිනැති අංක 2149 දරන ගැසට් පත්‍රයේ හා 2019 ඔක්තෝබර් මස 25 වැනි දින ''ඩේලිනිව්ස්'', ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම **2021 අගෝස්තු මස 11 වැනි දින පෙ. ව. 10.00** ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර සමාගමේ එම්. එච්. තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ අංක 8 (කොල්ලුපිටිය) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සහ කොළඹ මහ නගර සභා සීමාවේ කොල්ලුපිටිය පෙන්ඩෙනිස් ඇවනියුහි (දැනට අබ්දුල් ගෆූර් මාවත ලෙස ප්‍රසිද්ධ) පිහිටි ''මිලිසෙන්ට් කොටේජ්'' යැයි කියනු ලබන සහ එනමින් ප්‍රසිද්ධ කලින් වරිපනම් අංක $60^{K2}$ දරන (පසුව වරිපනම් අංක 08 දරන) සීමා විස්තර කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට පටුමගක් ද, නැගෙනහිරට එච්. දොන් කරෝලිස් සහ පුත්‍රයන්ට අයිති පෙන්ඩෙනිස් ලෙස ප්‍රසිද්ධ පරිශ්‍රය ද, දකුණට සී. ඩබ්. ලෙවිස් පෙරේරාට අයිති ''කිලර්නි'' ලෙස ප්‍රසිද්ධ පරිශ්‍රය ද, බස්නාහිරට ''බ්ලෙන්හිම්'' ලෙස ප්‍රසිද්ධ වරිපනම් අංක $60^{K1}$ දරන පරිශ්‍රය ද, මායිම්ව බලයලත් මිනින්දෝරු එච්. සී. ඩයස් විසින් සාදන ලද 1915.05.01 දිනැති අංක 1705 දරන මැනුමෙහි සහ එහි විස්තරයට අනුව පර්චස් දාහතක් සහ පර්චසයකින් දහසෙන් තුන්සිය හැත්තෑ පහක පංගුවක (අ. 0, රූ. 0, පර්. 17 375/1000) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියළු දේ සමඟ වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1003/238 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු වී. කාර්තිගේසු විසින් පසුව සාදන ලද 1946/02/08 දිනැති අංක 518 දරන මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවේ, කොල්ලුපිටිය පෙන්ඩෙනිස් ඇවනියුහි (දැන් අබ්දුල් ගෆූර් මාවත ලෙස ප්‍රසිද්ධ) පිහිටි ''මිලිසෙන්ට් කොටේජ්'' නමැති කලින් වරිපනම් අංක $60^{K2}$ දරන (පසුව වරිපනම් අක 08 දරන) සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට පෙන්ඩෙනිස් ඇවනියු ද (දැන් අබ්දුල් ගෆූර් මාවත ලෙස ප්‍රසිද්ධ) නැගෙනහිරට පෙන්ඩෙනිස් ඇවනියු හි (දැන් අබ්දුල් ගෆූර් මාවත ලෙස ප්‍රසිද්ධ) දැන් වරිපනම් අංක 10 දරන පරිශ්‍රය ද, දකුණට ගාලු පාරේ දැන් වරිපනම් අංක 295 දරන පරිශ්‍රය ද, බස්නාහිරට ගාලු පාරේ දැන් වරිපනම් අංක 293 දරන පරිශ්‍රය ද, මායිම්ව පර්චස් දාහතයි දශම තුනයි හතයි පහක (අ. 0, රූ. 0, පර්. 17.375) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියළු දේ ද සමඟ වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1003/238 හි ලියා පදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් මෑතක දී සාදන ලද 2008.05.28 දිනැති අංක 3802 දරන මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී කොල්ලුපිටියෙහි පිහිටි අබ්දුල් ගෆූර් මාවතේ වරිපනම් අංක 06 දරන, අංක 3802 දරන එකී පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : අබ්දුල් ගෆූර් මාවත ද, නැගෙනහිරට : අබ්දුල් ගෆූර් මාවතේ වරිපනම් අංක 10A දරන පරිශ්‍රය ද, දකුණට : ගාලු පාරේ වරිපනම් අංක 295 දරන පරිශ්‍රය ද, බස්නාහිරටඃ ගාලු පාරේ වරිපනම් අංක 293 දරන පරිශ්‍රය ද , මායිම් ව පර්චස් දහතයි දශම දෙකයි නවයක (අ. 0, රූ. 0, පර්. 17.29) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ සමඟ වේ.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රධාන කළමනාකාරිණී,
(ආයතනික අයකර ගැනීම්).

ලංකා බැංකුව,
ආයතනික අයකර ගැනීම් අංශය,
3 වන මහල, ලංකා බැංකු චතුරශ්‍රය,
අංක 01, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

07-320

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මහනුවර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව ඩබ්ලිව්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණය උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කරන ලද දේපළ **2021 ක් වූ අගෝස්තු මස 13 වැනි දින පෙ. ව. 10.30** ට දේපළ පිහිටි ස්ථානයේ දී ආරම්භ වන ප්‍රසිද්ධ වෙන්දේසියේ දී මා විසින් විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ දඹුල්ල මහනගර සභා සීමාව තුළ දඹුල්ල නගරය ග්‍රාම නිලධාරි වසම දඹුල්ල ගමේ පිහිටි ''දෙහිගහමුල්ලයාය කටුපොත'' නමැති

බෙදා වෙන් කරන ලද ඉඩමට සහ පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු ඊ වී සිරිසුමන විසින් සාදන ලද අංක 7650 සහ 2007.07.05 වැනි දින දරන පිඹුරේ දක්වෙන බෙදා වෙන් කරන ලද ලොට් 01 දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, ප්‍රමාණය පර්චස් 10 ඉඩම සහ ඊට අයත් සියලු දේ සමග.

*දේපළට පිවිසීම.* - දඹුල්ල නගරයේ සිට මහනුවර පාරේ කි. මී. බාගයක් පමණ 73/2 දරන බෝක්කුව දක්වා පැමිණි විට අදාල දේපළ මෙම පාරේ දකුණු පසින් පාරට මායිම්ව පිහිටා තිබේ.

යෝජනා සම්මුති සඳහා 2020.09.18 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2021.03.29 වැනි දින මව්බිම, ඬේලිමිරර් හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකරු (වාණිජ අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011- 2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 071- 4962449/ 071 8446374

07-427

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මහනුවර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව ඩබ්ලිව්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණය උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කරන ලද දේපළ **2021 ක් වූ අගෝස්තු මස 13 වැනි දින පෙ. ව. 11.30** ට දේපළ පිහිටි ස්ථානයේ දී ආරම්භ වන ප්‍රසිද්ධ වෙන්දේසියේ දී මා විසින් විකුණනු ලැබේ.

1. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ කුඩුක්කන්දන්වෙල ඊ 488 දරන ග්‍රාමනිලධාරි වසම කුඩුක්කන්දන්වෙල ගමේ පිහිටි ''මහකපුයාය'' නමැති ඉඩමට සහ පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් සාදන ලද අංක 4765 සහ 2009.11.03 වැනි දින දරන පිඹුරේ (ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ සර්වේයර් ජෙනරාල් විසින් සහතික කරන ලද අංක වීපී 510 දරන පිඹුරෙහි දක්වෙන ලොට් 389, 390 392 393 394 395 396 397 398 399 401 402 404 405 406 407 412 413 ඒකාබද්ධ කරන ලද) ලොට් බී දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩම් ප්‍රමාණය අක්කර 38 රූඩ් 03 පර්චස් 09 විශාල ඉඩම.

2. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ කුඩුක්කන්දන්වෙල ඊ 488 දරන ග්‍රාම නිලධාරි වසම කුඩුක්කන්දන්වෙල ගමේ පිහිටි ''මහකපුයාය'' නමැති ඉඩමට සහ පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් සාදන ලද අංක 4764 ඒ සහ 2009.11.03 වැනි දින (ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත) යටතේ සර්වේයාර් ජෙනරාල් විසින් සහතික කරන ලද අංක වීපී 510 දරන පිඹුරෙහි දක්වෙන ලොට් 353 1/2, 354 355 1/2 356 357 358 360 361 362 363 364 368 1/2 368 2/2 371 372 374 376 377 378 379 380 381 382 383 385 387 388 409 411 සහ 385 ඒකාබද්ධ කරන ලද) ලොට් ඒ 1 වශයෙන් දක්වෙන ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය අක්කර 46 රූඩ් 01 පර්චස් 39 විශාල ඉඩම.

*දේපළට පිවිසීම.* - දඹුල්ල නගරයේ සිට මහනුවර පාරේ (ඒ 9 මාර්ගයේ) කි. මී. 1.5ක් පමණ කන්ඩලම හන්දිය දක්වා ගමන් ගෙන වමට හැරී දඹුල්ල බකමූන පාරට පිවිස එම පාරේ සැතපුම් 2 කණුව හන්දිය දක්වා ගමන් ගෙන වමට හැරී කන්ඩලම පාරට පිවිස කි. මී. 01ක් පමණ ඇරව්වල හන්දියට පැමිණ වමට හැරී වේවල පාර ඔස්සේ කි. මී. 09ක් පමණ කන්ඩලම වැව සහ අමායා ලේක් හෝටලය පසු කර දකුණට පිහිටි පාරට පිවිස එම පාරේ ස්වල්ප දුරක් ගමන් ගත් පසු අදාළ දේපළ පිහිටා තිබේ. මෙම දේපළ මහාකපුයාය නමින් ප්‍රසිද්ධව හැඳින්වේ.

යෝජනා සම්මුති සඳහා 2020.09.18 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2021.03.29 වැනි දින මව්බිම, ඩේලිමිරර් හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකරු (වාණිජ අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011- 2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 071- 4962449/ 071 8446374

07-428

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කළුතර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කළුතර ව්‍යාපාර ලියාපදිංචි අංක W/BB 6623 දරන ෆැෂන් යූ - ටර්න් යන නාමය විලාසය සහ අභිධානය යටතේ තනි ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කළුතර පදිංචි වෙල් අරුමගේ උෂාන් උෂාන් කෝසල ප්‍රනාන්දු යන අය බැදුම්කරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, ප්‍රසිද්ධ නොතාරිස් එච්. කේ. ගීතිකා පෙරේරා විසින් දෙකම සහතික කරන ලද 2018.10.29 දිනැති බැදුම්කර අංක 1875 සහ 2018.10.29 දිනැති අංක 1876 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ, වර්ෂ **2021 ක් වූ අගෝස්තු මස 13 වැනි දින ප. ව. 1.00** ට සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරන ලද බලය ප්‍රකාරව සෙලාන් බැංකුව කළුතර ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් Covid 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, තොටමුණේ උතුර කළුතර බැද්ද, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කළුතර ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 731-ඒ කලමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසය වඩාත් නිවැරදිව 731- කලමුල්ල උතුර තුළ කලමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු ඕ. එස්. ඕ. කුමාරසිරි විසින් සාදන ලද 2018.05.30 දිනැති අංක 6060 සැලැස්මේ නිරූපනය වන මාවතබොඩවත්ත සහ තලඑළියේවත්ත නමැති සම්පූර්ණ බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ ලකුණු කළ (බ. මි. එල්. ඩබ්ලිව්. පෙරේරා විසින් සැලසුම් දෙකම සකස් කරන ලද 2017.08.12 දිනැති අංක 3866 සැලැස්මේ සඳහන් ලොට් බී1ඒ සහ 2017.09.30 දිනැති අංක 3888 සැලැස්මේ සඳහන් ලොට් 1ඒ එකතුකිරීමක් සහ නැවත මැනීමක් වන) ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහසයයි දශම එකයි බිංදුවක් (අ. 0. රූ. 1, පර්. 16.10) නොහොත් හෙක්ටයාර් 0.14189 විශාල ඉඩම.

*දේපළට පිවිසීම.* - කළුතර ඔර්ලෝසු කණුව අසල සිට ගාලු පාර ඔස්සේ අලුත්ගම දෙසට 3.0 kmක් කටුකුරුන්ද හන්දිය දක්වා පැමිණ තවත් මීටර් 850ක් ඉදිරියට ගිය පසු මෙම විෂයගත දේපළ දකුණු පසින් වන්නට පිහිටා ඇත. තවද 46km කණුවට මීටර් 50ක් ඉදිරියෙනි.

*යෝජනා සම්මුති දැන්වීම.* - 2021.02.25 දිනැති *රජයේ ගැසට් පත්‍රයේ* ද, ඩේලි මිරර්, අද සහ ටැමිල් මිරර් පුවත් පත්හි 2021.02.12 පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,

(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හා වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. නීති ප්‍රධානී සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456485, 011-2456479, 011- 2456473.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9, අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ,
හෝමාගම.
දුරකථන අංක : 071- 4318252.

07-461

---

## සෙලාන් බැංකුව පීඑල්සී - දඹුල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දඹුල්ල සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ සිය ලියාපදිංචි අංක පීවී 71074 ඇති 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ආර්. එස්. ඉම්පෝර්ට්ස් (පීවීටී) ලිමිටඩ් සහ දඹුල්ල පදිංචි රොහාන් රණසිංහ යන අය බැඳුම්කරු/උකස්කරු වශයෙන් ගෙවීම් පැහැර හැර ඇති හෙයින් ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ද ලීමා විසින් සියල්ල සහතික කරන ලද 2017.01.06 දිනැති බැඳුම්කර අංක 1523, 2017.03.27 දිනැති 1556, 2019.02.12 දිනැති 1831 සහ 2017.08.22 දිනැති 1897 මගින් සෙලාන් බැංකුව පී එල් සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් දේපළ, වර්ෂ **2021 ක් වූ අගෝස්තු මස 17 වැනි දින** පහත සඳහන් කරන ලද වේලාවන්හි දී සෙලාන් බැංකුව පීඑල්සී දඹුල්ල ශාඛා පරිශ්‍රයේ දී සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරන ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් Covid 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*1 වන වෙන්දේසිය* - **වේලාව පෙ. ව. 11.00**

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ, පල්ලේසියපත්තුවේ, දඹුල්ල මහ නගර සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කපුවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ තිත්තවැල්ගොල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එම්. සී. බී. බී. හිටිහාමු විසින් සාදන ලද 2016.12.23 දිනැති අංක 605 දරන සැලැස්මේ නිරූපනය වන අඹගහමුල යාය කොටසක් නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් සාදන ලද 2007.08.10 දිනැති අංක 2007/PO/336 සැලැස්මේ නිරූපනය වන ලොට් 1 ලකුණු කළ ඉඩමේ නැවත මැනීමක් වන) බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - දඹුල්ල සෙලාන් බැංකුවේ සිට මාතලේ පාර ඔස්සේ 5.34km ක් පමණ පැමිණි පසු මෙම විෂයගත දේපළ JC Villa Tourist Hotel පසුකරනවාත් සමගම වම් පසින් වන්නට පිහිටා ඇත.

